# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

ඒකාබද්ධ වෘත්තීය සමිති
එකමුතුව
49/53 බී
සල්මල් උයන
කිරිදිවැල පාර
යක්කල

<u>අභියාචක</u>

**අභියාචනා අංකය :**
**RTIC/Appeal/ 680/2022**

එදිරිව

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු
සංස්ථාව
තැ.පෙ. 194
130 ඩබ්ලිව් ඒ ඩී රාමනායක
මාවත
කොළඹ 02

<u>පොදු අධිකාරිය</u>

**ඉදිරිපිටදී :**

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
5. මොහොමඩ් නහියා - කොමසාරිස්

**පෙනී සිටීම :**

අභියාචක සිටී.

පොදු අධිකාරිය වෙනුවෙන් සූම් තාක්ෂණය ඔස්සේ නීතිඥ සුමේධා බස්නායක මිය පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම් :**

අභියාචක - ඉදිරිපත් කර නැත

පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත

**විභාග කළ දිනය :** 2022.08.25, 2022.10.12

**තීරණය කළ දිනය :** 2022.10.12

## <u>කොමිෂන් සභාවේ තීරණය</u>

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 2022.01.26 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

*පරිපාලනමය මෙන්ම ආයතනික සාමාන්‍ය තොරතුරු විමසීම*

*1. යම් අයකු ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් ලියාපදිංචි තැපැල මගින්, සාමාන්‍ය තැපැල මගින්, අතින් ආයතනයට භාර දීමෙන් හෝ වෙන යම් ආකාරයකින් විමසන ලද විමසන ලද කරුණක් / ඉල්ලීමක් සඳහා පිළිතුරු සැපයීමට සංස්ථාවේ පිළිගත් නියමිත දින ගණන සහ ඒ සබැදිව භාවිත කරන ක්‍රමවේදය දක්වන සියලු මූලාශ්‍ර ලේඛනයෙහි සහතික කල පිටපතක්.*

*2. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව තම ආයතනයේ සියලුම පරිපාලන කටයුතු සහ මූල්‍ය කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා භාවිත කරන මූලාශ්‍ර ලේඛනයේ සහතික කරන ලද පිටපතක්.*

*3. පුහුණු සේවකයකු සහ නුපුහුණු සේවකයකු යන තනතුරු සඳහා ඇති පැහැදිලි නිර්වචන දක්වන මූලාශ්‍ර ලියවිල්ල*

*අ. නුපුහුණු සේවකයකු පුහුණු සේවකයකු ලෙස පත් කරන කාලය, පරිවාස කාලය, වෛද්‍ය පරීක්ෂණ සඳහා යොමු කරනු ලබන ක්‍රමය තීරණය කරනු ලබන මූලාශ්‍ර ලේඛනය*

*ආ. සංස්ථාවේ තාක්ෂණික සහ තාක්ෂණික නොවන කටයුතු එකිනෙකට වෙන් කර ගනු ලබන ක්‍රමවේදය දක්වන මූලාශ්‍ර ලේඛනය මෙන්ම නුපුහුණු සේවකයකු/පුහුණු සේවකයකු තාක්ෂණික හෝ තාක්ෂණික නොවන කටයුතු වල යොදා ගන්නේ නම් සංස්ථාව තුල 2015 වසරේ සිට මේ දක්වා ඔවුන්ට පැවරී ඇති තාක්ෂණික හෝ තාක්ෂණික නොවන රාජකාරි කාර්යයන් දක්වන මූලාශ්‍ර ලේඛනය*

*ඇ. බඳවාගත් දින සිට කළමනාකාර සහයක තනතුරේ කාර්ය ආවරණයට සේවයේ යොදවා ඇති පුහුණු හෝ නුපුහුණු සේවකයකු ඉන් ඉවත් කර කම්කරුවකුගේ කාර්යයන්හි යෙදවීම සම්බන්ධව ආයතනික ක්‍රමවේදය සඳහන් මූලාශ්‍ර ලේඛනය*

*ඈ. නුපුහුණු සේවකයෙකු එසේ පුහුණු වන්නේ කුමන වෘත්තියකද පුහුණු සේවකයකු එසේ පුහුණු වී ඇත්තේ කුමන වෘත්තියකටද යන්න තනතුරු නාමයෙහි දක්වනු ලබන්නේද එසේ නොදක්වන්නේ නම් ඔහුගේ ආයතනික රාජකාරි ස්වභාවය තනතුරු නාමයෙන් තීරණය කරනු ලැබීමට ආයතනය අනුගමනය කරන ක්‍රියාමාර්ග යනාදිය සඳහන් මූලාශ්‍ර ලේඛනය*

*උදාහරණ:*

*නුපුහුණු සේවක (පයිප්ප වැද්දුම්) හෝ පුහුණු සේවක (පයිප්ප වැද්දුම්)*
*නුපුහුණු සේවක (වඩු කාර්මික) හෝ පුහුණු සේවක (වඩු කාර්මික)*
*නුපුහුණු සේවක (ආරක්ෂක නියාමක) හෝ පුහුණු සේවක (ආරක්ෂක නියාමක)*
*නුපුහුණු සේවක (විගණන) හෝ පුහුණු සේවක (විගණන)*
*නුපුහුණු සේවක (කලමනාකාර සහකාර) හෝ පුහුණු සේවක(කළමනාකාර සහකාර)*

*ඉ. පුහුණු සේවකයකු හෝ නුපුහුණු සේවකයකු (ඔහු සුදුසුකම් ලත් කළමනාකරණ සහායකයකු නොවන්නේනම්) සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ විගණන අංශයේ සේවය කල නොහැකි යයි සඳහන් මූලාශ්‍ර ලේඛනය*

*04.*

අ. 2019 නොවැම්බර් මස සිට මේ දක්වා ආයතනය විසින් වැඩ තහනම් කර ඇති, සේවය අතහැර යාම නිවේදනය කර ඇති, අනිවාර්ය නිවාඩු යවා ඇති සහ ස්ථාන මාරු සිදු කර ඇති සියලුම සේවකයන්ගේ නාම ලේඛනය

ආ. ඔවුන් විසින් ඒ සම්බන්ධව ආයතනයට විරුද්ධව ගෙන ඇති නීතිමය පියවර යනාදිය සඳහන් සංස්ථා නීති නිලධාරිනිය විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනය

05. "සේවා අවශ්‍යතා" යන්න ආයතනය තුල නිර්වචනය කරන මූලාශ්‍ර ලේඛනය

06. 2020 ජූලි 15 දිනට දංකොටුව වැඩ බිමෙහි පුහුණු සේවකයකු (විගණන කටයුතු කරනු ලැබූ) සහ පුහුණු සේවකයකු (වඩු කාර්මික) සඳහා පැවති කෙටි කාලින හෝ දීර්ඝ කාලින සේවා පුරප්පාඩු සබැඳිව මානව සම්පත් හා පරිපාලන අංශයේ පැවති සහතික කරනු ලැබූ ලිඛිත සටහන්

07. බැහැර සේවාපතක් මත සේවකයකු අඛණ්ඩව සේවයේ යෙදිය හැකි උපරිම දින ගණන කීයද සහ ඊට පාදක කර ගන්නා මූලාශ්‍ර ලේඛනය

08. ආයතනික ස්ථාන අරු කිරීමක් සිදු කරන නිසි ක්‍රමවේදය සඳහන් මූලාශ්‍ර ලේඛනය

09. ආයතනය 2015 පසු බඳවා ගත් සේවකයින්ට ඔවුන් නියුක්ත කරන රාජකාරි සම්බන්ධව කාර්ය ලේඛනයක් ලබා දෙන්නේද එසේ නොදෙන්නේනම් ඊට හේතුව යනාදිය සඳහන් මූලාශ්‍රය.

10. සේවකයකු සම්බන්ධව යම් පැමිණිල්ලක් ලැබුණු අවස්ථාවකදී එමපමිනිල්ල සම්බන්ධව ආයතනය විසින් සිදු කරනු ලබන නිසි ක්‍රමවේදය සඳහන් මූලාශ්‍ර ලේඛනය

11.

අ. ආයතනයේ පරිපාලනයට සම්බන්ධව ඇති වෘත්තීය සමිති නියෝජිතයින් කුමන වෘත්තීය සමිතියක් නියෝජනය කරන්නේද කවුරුන්ද යන්න දක්වන සහතික කල නාම ලේඛනය

ආ. "ආයතනයේ පරිපාලන සම්බන්ධ තීන්දු ගැනීමට, සේවක ස්ථාන මාරු කිරීමට යෝජනා කිරීමට, ආයතනය වෙනුවෙන් පැමිණිලි ලැබීමට සහ ආයතනය වෙනුවෙන් ඔවුනට ලැබුණු පැමිණිලි විමර්ශන කටයුතු කිරීමට සහ ඒ සම්බන්ධව පරිපාලනයට බලපෑම් කිරීමට සංස්ථායිය වෘත්තීය සමිති වලට හැකියාවක් තිබේ" යන්න තහවුරු කරනු ලබන මූලාශ්‍ර ලේඛනය

ඇ. සංස්ථායිය පොදු ජන පෙරමුණේ ලේකම්ගේ අත්සනින් 2020 පෙබරවාරි 03 දිනැති මානව සම්පත් හා පාලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීට යොමු කරන ලද සංශෝධනය කරන ලද නිලධාරී මණ්ඩලය දක්වන ලිපියේ සහතික කරන ලද පිටපත

12. ආයතනයේ සංචිතයට (100/49) සේවකයකු අනුයුක්ත කරන ලබන අවස්ථාවන් දක්වන මූලාශ්‍රය සහ 2020 ජනවාරි සිට 2020 දෙසැම්බර් දක්වා සංචිතයේ (100/49) සිටි සේවකයින්ගේ නාම ලේඛනය සහ ඉන් පසු ඔවුන් සංචිතයෙන් ඉවත් කර වෙනත් සේවා ස්ථාන වලට අනුයුක්ත කර ඇති නම් වෙන් වෙන් වශයෙන් ඒ කුමන හේතුන් මතද යන්න තහවුරු කරනු ලබන ලිඛිත සටහන්

13. 2019 දෙසැම්බර් මස සිට අද දිනට ආයතනය විසින් සේවකයාගෙන් සඳහා සේවක අර්ථ සාධක අරමුදලට ගෙවා ඇති සම්පූර්ණ මුදල සහතික කරනු ලබන මුදල් ප්‍රේෂණ පත්‍ර

*14. 2020.02.27 දින ස්ථාන මාරුවක් ලෙස අභන්තර විගණන අංශයේ සිට සංචිතයටත් ඉන් පසු 2020.07.15 සිට දංකොටුව වැඩ බිමටත් බැහැර සේවා පතකින් ස්ථාන මාරු කර ඇති උදය රෝහණ ගම්හිර ආරච්චි (එම් 197645) මහතාගේ*

*අ. විගණන අංශයේ සිට සංචිතයට මාරු කල යුතු යැයි සාමාන්‍යාධිකාරී නියෝග කර සිටින ස්ථාන මාරු ලිපියට අනුව 2020.02.20 දිනැති උප සභාපතිගේ ලිපියෙහි සහතික කරන ලද පිටපත් හා සමයනධිකරිගේ නියෝගයේ සහතික කරන ලද පිටපත*

*ආ. එසේ සාමාන්‍යාධිකාරීට, උප සභාපතිට හෝ සභාපතිගේ රුචි අරුචිකම් මත පිහිටා සංස්ථා සේවකයින් ස්ථාන මාරු සිදු කිරීම් සිදු කල හැකි අවස්ථා සඳහන් මූලාශ්‍ර ලේඛනය*

*ඇ. 2020.02.20 දිනැති උප සභාපතිගේ ලිපිය චේතනාන්විතව අස්ථාන ගත කර එමගින් ඔහුට මේ දක්වා සිදුව ඇති හානි ප්‍රතිපූර්ණයට සංස්ථාව ගෙන ඇති පියවර සඳහන් ලේඛනයෙහි සහතික කරන ලද ලිපිය*

*ඇ. ඔහු සම්බන්ධව 2020 පෙබරවාරි 11 සහ 2020 ජූලි 08 දිනයන්හි දී සංස්ථායිය වාණිජ කර්මාන්ත හා සේවා ප්‍රගතිශීලි සේවක සංගමයේ උප සභාපති එන්.පී. චාරුක නිරංජන් සහ ලේකම් පී.එපී. කුරේ විසින් ආයතනයේ පරිපාලනාධිකාරියට කරනු ලැබ ඇති පැමිණිලි සම්බන්ධව සහතික කල පැමිණිලි පිටපත් මෙන්ම සංස්ථාව විසින් ඒ සබැඳිව ලබන පරීක්ෂණයේ වර්තමාන තත්වය සහ ඊට අයත් සහතික කල කාර්ය සටහන් පත්‍ර*

*ඉ.සංචිතයේ සිට දංකොටුව වැඩබිමට කරන ලද ස්ථාන මාරු කිරීමට අදාලව 2020 සැප්තැම්බර් 16 දිනැති ලිපිය සහකාර පිරිස් කළමනාකාර ගාමිණී මාකොළ විසින් ඔහුට භාර දෙන අවස්ථාවේ ඔහු විසින් භාරගත් බවට අත්සන යෙදු හෝ ලියාපදිංචි තැපැල මගින් එය ඔහු වෙත යවන ලද්දේ නම් ලියාපදිංචි කුවිතාන්සියේ පිටපතක් සමග එම ස්ථාන මාරු ලිපියේ සහතික කල පිටපතක්*

*ඊ. 2020 සැප්තැම්බර් 24 දින උදය රෝහණ ගම්හිර ආරච්චි (එම් 197645) මහතාට ආයතනයට ඇතුළු වීම වළක්වමින් ඉහලින් දෙනු ලැබ ඇති උපදෙස් මත ආරක්ෂක අංශය එදින ක්‍රියාකර ඇති බැවින් ඒ සබැඳිව ආරක්ෂක අංශ සටහන් පොතෙහි (IB Note) යොදනු ලැබ ඇති සටහනෙහි සහතික කල පිටපතක්*

*15. 2015 වසරෙහි දේශපලන පලිගැනීම් සිදු කරනු ලැබුවයැයි ආයතනය විසින් උසස් වීම ලබා දි ඇති සේවකයින් මිට පෙර සිටි තනතුර සහ උසස් වීම් ලබාගත් තනතුර සඳහන් කරමින් ඔවුන්ගේ එම් අංක සහිත සම්පූර්ණ නම ලේඛනයෙහි, ඒ සඳහා යොමු කල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවෙහි මෙන්ම දෙනු ලැබූ සියලු අනුමතීන්හි සහතික කරන ලද පිටපත්*

*16. අනියම් සේවයේ සිට 2019 දී ස්ථිර වූ සේවකයින්ට 2020 වසරෙහි ජනවාරි මස (2019 වසර පාදක කර ගෙවනු ලබන) ප්‍රසාද දීමනාව ගෙවූ බව තහවුරු කරන මූලාශ්‍ර ලිපි*

*17. වරලත් ගණකාධිකරණ ආයතනය හෝ ගණකාධිකරණ ශිල්පී ආයතනය විසින් තමන්ගේ සාමාජිකයන්ට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ප්‍රයෝගික පුහුණුව සම්පූර්ණ කල හැකි ආයතනයක් ලෙස ඔවුන්ගේ සයිබර් දත්තව සඳහන් කර ඇත.*

*අ. ඒ අනුව සංස්ථාව විසින් එකී ආයතනයන් සමග නිත්‍යානුකූල ගිවිසුම් ගතව එසේ පුහුණුව ලබන හෝ පුහුණුව සම්පූර්ණ කර ඇති හෝ යම් අයකු විගණන හෝ ගිණුම් අංශයෙහි හෝ තමන් පුහුණුව ලැබීමට අනියුක්ත කරන අද අංශයෙන් ඉවත් කර පුහුණුව ලැබූ ක්ෂේත්‍රයට කිසිත් නොගැලපෙන සේවයක දීමට සංස්ථාවට බලතල ඇත යන්න සඳහන් මූලාශ්‍ර ලේඛනය*

*ආ. පුහුණු සේවකයකු විගණන අංශයේ විගණන කටයුතු වල හෝ ගිණුම් අංශයේ ගිණුම් කටයුතු සම්බන්ධව සේවයේ දීමට අනීතික බව සදහන් ලිඛිත මූලාශ්‍රය*

*ඇ. එහිදී එකී පුහුණු සේවකයා විසින් ප්‍රධාන අභන්තර විගණකගේ හෝ ගණකාධිකරිවරයාගේ අධීක්ෂණය යටතේ ගනු ලබන පරීක්ෂණ නිත්‍යානුකූල නොවන බව සදහන් මූලාශ්‍රය*

*18. 2019 නොවැම්බර් මස සිට මේ දක්වා ආයතනය අනියම් පදනම මත, කොන්ත්‍රාත් පදනම මත සහ ස්ථිර කිරීමේ පදනම මත සේවයට බදවා ගෙන ඇති සේවකයන්ගේ සම්පූර්ණ නාම ලේඛනය*
*19.අ. 2021 මැයි 05 දිනැති GM /Y 21/M /4R/032 දරන අභ්‍යන්තර මෙමොවේ සහතික කරන ලද පිටපත*

*ආ. අභ්‍යන්තර විගණක ගේ තනතුරේ වැඩ බැලීමට තුෂාර විතානගේ පත් කරන ලද ලිපියේ පිටපත ඇතුළු එමගින් වැඩ බැලීමට පත් කරන ලද සියලු අයගේ පත් කිරීමේ ලිපි සියල්ලේ සහතික කරන ලද පිටපත් සමග ඊට අනුමැතිය දෙන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඇතුළු සියලු ලිපිවල සහතික කල පිටපත්*

*ඇ. වැඩ බලන විගණක නිලධාරී තුෂාර විතානගේ සංස්ථාවට පත් කරනු ලැබූ මුල් පත්වීමේ සහ ස්ථිර කරන ලද පත්වීමේ ලිපියේ සහතික කරන ලද පිටපත්*

*ඇ. වැඩ බලන විගණක නිලධාරී තුෂාර ලියනගේ එසේ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ගේ වැඩ ආවරණය කිරීම උදෙසා ලබා දී ඇති ඉහලම වෘත්තීය සහතිකයේ සහතික කරන ලද පිටපතක්*

*ඉ. අභ්‍යන්තර විගණක අංශයේ චන්දිම ධර්මප්‍රිය, අශෝක රාජපක්ෂ සහ කසුන් ලක්මාල් යන නිලධාරීන් වර්තමානයේ උසුලන තනතුර සදහා ඔවුන්ට දෙන ලද ලිපි වල සහතික කරන ලද පිටපත් සහ 2015 ජනාධිපතිවරණය සදහා බැහැර සේවා පත් මත දේශපාලන වැඩ වලට සම්බන්ධ වීම හේතුවෙන් ඔවුන්ගෙන් අසන කඩ නිදහසට කරුණු දැක්වීම සම්බන්ධ ලිපි, බැහැර සේවා පත්, විගණක වාර්තා, කෝප් කමිටු වාර්තා ඇතුළු සියලු ලේඛනයන්හි සහතික කරන ලද පිටපත්*

*ඊ. වැඩ බලන විගණක නිලධාරී තුෂාර විතානගේට සංස්ථාව විසින් එකී වැඩ ආවරණය සදහා ගෙවනු ලබා මුදලෙහි ගෙවීම් විස්තර සහ ඊට අනුමැතිය දෙන ලද සියලුම ලේඛනයන්හි සහතික කරන ලද පිටපත් සහ භුක්ති විදින ආයතනික වරප්‍රසාද සදහා හිමිකම් ඇති බවට සනාථ කරන මූලාශ්‍ර ලේඛනය*

*20. අ. වෘත්තීය සමිති ක්‍රියාමාර්ග ගැනීම සේවය තහනම් කිරීමට හේතුවන බව දක්වා ඇති මූලාශ්‍ර ලේඛනය*
*ආ. "අ " යටතේ කී මූලාශ්‍රය පදනම් කර ගනිමින් සේවය තහනම් කිරීමේ ක්‍රමවේදය සහිත මූලාශ්‍රයන්*

*21. අ. සහකාර පිරිස් කලමනාකර මහින්ද සමරතුංග නැවත සේවයේ පිහිටුවන ලැබූ ලිපියේ සහ ඊට පාදක වූ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවන් ඇතුළු ලේඛන අවල සහතික කරන ලද පිටපත්*

*ආ. ඔහු සංස්ථාවට එදිරිව පවරනු ලැබූ නඩු කටයුතු සියල්ල සම්බන්ධව ගරු අධිකරණය විසින් දී ඇති තිරනයන්හි නඩු අංක සමග සහතික කරන ලද පිටපත්*

*ඇ. ඔහුට සංස්ථාව විසින් ගෙවනු ලැබ ඇති වන්දි මුදලෙහි ගෙවීම් විස්තර සහ ඊට අනුමැතිය දෙන ලද සියලුම ලේඛනයන්හි සහතික කරන ලද පිටපත්*

*22. සංස්ථායිය ජාතික නිදහස් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් සංස්ථා රියදුරු ආර්.කේ.පී.එල්. ද සිල්වා ප්‍රවාහන අංශයේ වැඩ අධීක්ෂණයට පත් කරන ලද ලිපියේ සහතික කරන ලද පිටපතක් සහ ඊට*

*අනුමැතිය දෙන ලද ලිපිය මෙන්ම ඒ සඳහා ඔහුගේ ඉල්ලුම් ලිපිය යනාදියෙහි සහතික කරන ලද පිටපත්*

*23. සංස්ථායිය වාණිජ කර්මාන්ත හා සේවා ප්‍රගතිශීලි සේවක සංගමයේ උප සභාපති එන්. පී වාරුක නිරංජන්, ලේකම් පී.එල්.පී. කුරේ , සභාපති බී.ඩී.පී.ආර්. කුමාර, සංස්ථායිය ජාතික නිදහස් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් ආර්.කේ.පී.එල්. ද සිල්වා සහ සභාපති ජී.එච්. සමීර සුදර්ශන ලබා ඇති ඉහලම අධ්‍යාපන සුදුසුකම් හි සහතික කරන ලද පිටපත් සහ ඔවුන්ගේ මුල් පත්වීමේ ලිපි සහ වර්තමානයේ සංස්ථාවේ දරන තනතුර සඳහන් සහතික කරන ලද ලේඛනය*

*24. සංස්ථායිය තොරතුරු නිලධාරී විසින් නඩත්තු කල යුතු තොරතුරු ඉල්ලුම් ලියාපදිංචි ලේඛනයේ (ආර්.ටී.අයි. 3) සහ සංස්ථායිය නම් කල නිලධාරී විසින් නඩත්තු කල යුතු තොරතුරු අභියාචනා ලේඛනයෙහි (ආර්.ටී.අයි. 9) මැයි මස සිට මේ දක්වා සහතික කරන ලද පිටපත්*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව, නියමිත කාලය තුල පිළිතුරු සැපයීමට අපොහොසත් ව ඇති බැවින් අභියාචක විසින් *2022.02.17* දිනැතිව නම් කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමු කර ඇත.

ඉන්පසු තොරතුරු නිලධාරි විසින් 2022.03.10 වන දින පහත ප්‍රතිචාරය දක්වා ඇත.

*ඔබ විසින් ඉදිරිපත් කර ඇත්තේ ඡායාස්ථ පිටපත් බැවින් තොරතුරු එක්රැස් කිරීමට අපහසු වී ඇත. එබැවින් කරුණාකර එහි මුල් පිටපත අපවෙත යොමු කරන මෙන් දන්වා සිටිමු.*

අභියාචක විසින් 2022.03.21 දින කොමිෂන් සභාව වෙත අභියාචනය ඉදිරිපත් කර ඇත

2022.08.25 වන දින පොදු අධිකාරිය විසින් තොරතුරු සමහරක් මුදා හරින ලද අතර එම තොරතුරු පරීක්ෂා කර බලා තොරතුරු ඉල්ලීමෙන් කුමන අංක යටතේ ඇති තොරතුරු සම්බන්ධයෙන් විමසීම සිදුකළ යුතුද යන්න දන්වන ලෙසට කොමිෂන් සභාව විසින් නියම කරන ලදී.

ඒ අනුව අභියාචක විසින් තොරතුරු ඉල්ලීම අයිතම 1, 2, 5, 6, 16, 17, 24 ට පොදු අධිකාරිය විසින් ප්‍රමාණවත් තොරතුරු සපයා ඇති බවත් ඇතැම් අයිතම වලට අදාළව අසම්පූර්ණ තොරතුරු ලබා දී ඇති බවත් සමහරක් තොරතුරු ලබා දී නොමැති බවත් 2022.09.20 දිනැති ලිපියෙන් දක්වා ඇත.

**සළකා බැලීම**

ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමට අදාළව එකී තොරතුරු ඉල්ලීමේ අංක 01, 02, 03, 05, 06, 16, 17 සහ 24 ට අදාළ තොරතුරු ප්‍රමාණවත් අයුරින් ලැබී ඇති බවට අභියාචක පිළිගනී. එසේ වුවත් අංක 04, අංක 07 සිට 15 සහ අංක 18 සිට 23 දක්වා අංක වලින් දැක්වෙන තොරතුරු ප්‍රමාණවත් අයුරින් ලැබී නොමැති බවට කරුණු ඉදිරිපත් කරයි. මෙම තොරතුරු මුදා හැරීම වාරණය කෙරෙන ව්‍යාතිරේකයන් අදාළ කර ගැනීමක් පොදු අධිකාරිය විසින් සිදු කර නොමැත. ඒ අනුව තොරතුරු මුදා හැරිය හැකිය යන ස්ථාවරයේ පොදු අධිකාරිය සිටින බව පැහැදිලිය.

එබැවින් එකී කරුණු සළකා බලා අංක 04, අංක 07 සිට 09, 11 සිට 15 සහ අංක 18 සිට 23 දක්වා අංක වලින් දැක්වෙන සියලුම තොරතුරු පොදු අධිකාරිය විසින් 2022.11.10 වන දිනට ප්‍රථම, මෙම කොමිෂන් සභාවටද පිටපත් සහිතව, අභියාචක වෙත මුදා හැරීමට ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය අවසන් කරන ලදී.